

පංදුක මොකද කල්පනාව බලාගත්තු අත බලාගෙන. පහුගිය දවස් වල ආසියානු කුසලානයයි පළවෙනි ටෙස්ට් මැච් එකයි දෙකම දිනුව නිසා මං හිතුවෙ තමුසෙ හරි සන්තෝසෙන් ඇති කියලා..

මොකද සන්තෝස නැත්තෙ ජගිරි මහත්තයා පිට පිටම දිනනකොට.. පුරස්නෙ ඒක නෙවෙයි.. මට ආමි එකේ මල්ලිලා ටිකක් හම්බ වුණා. මාස ගාණක් උතුරේ ඉඳලා සටන් බිමේ හොඳටම දුක් විඳලා කලුවෙලා අතපය දිහා බලන්නත් දුකයි. එයාලගෙ සමහර යාලුවෝ එයාලගේ ඇස් ඉස්සරහම මැරිලා වැටුණාලු සතුරන්ගෙ වෙඩි පාරවල් වලින්.

යුද්දෙ කියන්නෙ ඕක තමයි පන්දුක.. ඒ අයගේවීරකම් නිසානෙ අපට පහුගිය දවස් වලා සෑහෙන්න ජයග්‍රහණ ලැබුණෙ. රට වෙනුවෙන් ඒ අය කරන සේවෙට අපි දිවි හිමියෙන් ණය ගැතියි.

ඒක ඇත්ත ජගිරි මහත්තයා... ඒත්..

තෙපරබාන්නෙ නැතිව කියන දෙයක් කියපන් පංදුක.. මොකද ඒත් කියලා නැවැත්තුවේ.?

නෑ ජගිරි මහත්තයා.. ඒ ආමි එකේ මල්ලිලා කියනවා නිවාඩු ඉවර වෙලා ආපහු උතුරට යන්න හිතක් නැහැ ලු... කොළඹ කිරිකට් ක්ලබ් එකකට බැඳිලා කිරිකට් ගහනවලු පුලුවන් වීරිය දාලා .. ජීවිත පූජාවෙන් ජීවිත රැකගන්න සටන් කළත් එක පටියක් ගන්න මැරෙන්න ඕනෙලු.. ඒත් විකට් 6 ක් ආසියානු කප් එකේදි ගත්ත ගමන් අජන්ත සහෝදරයට කොමිසොන් නිලයක්ම ලැබුන ලූ.. ඒ අය ඒකට සන්තෝසයිලු.. ඒ අය කියනවා තව කප් එකක් අල්ලලා තව විකට් හය හතක් ගන්න කියලා ඒ සහෝදරයට. එතකොට ජනාධිපති තුමා හමුදාපති කමත් දෙයිලූ. එතුමා ලෝස් නැහැලු. තව තව ගොඩක් ඒව මේව කිව්වා ජගිරි මහත්තයා. ඒවා මෙතන කියන්නත් බැහැ..

පන්දුක ඒ ළමයා අජන්ත මෙන්ඩිස් නේ. අජන්ත රාජපක්ෂ නෙවෙයිනෙ.. ඒ ළමයට ප්‍රමෝෂන් වැලක් දීලා උනන්දු කරලා ගත්තම ඇති වරද මොකද්ද..? මට නං තේරෙන්නෙ නෑ..

ඒක තමයි ජගිරි මහත්තයා මමත් කල්පනා කළේ. අර පුතාව සුදුසුකම් හිටන් අඩු කරලා නේවි එකට බන්දලා ජාතියට බාර දෙනවා කියලා පුහුණුවට එංගලන්තෙට යවපු වෙලාවේ නම් ඔය වගේ දෙයක් කිව්වත් කමක් නෑ. ඔය හොඳට පන්දු කෙළින මල්ලිලාට මං නං එළ සපෝට්..

පංදුක තමුසෙ වාඩි වෙලා ඉන්නෙ මොලේ උඩද..?

සංක්‍රමණ මහත්තයත් පැටලෙන්න වගේ හදන්නෙ.

ඒ මනුස්සයට ප්‍රමෝෂන් එකක් දීලා උනන්දු කළාට කමක් නෑ. ඒකනේ හමුදාපති තුමා ඒ මනුස්සයට සාජන් පට්ටමක් දුන්නෙ.. හමුදාවක විනයක් සම්ප්‍රදායක් නීතියක් තියෙනවා.. ඒ ක්‍රියා පටිපාටියට අනුකූලව වැඩේ කෙරිලා නැති වගයි ඒ මල්ලිලා කියන්නෙ.. සෙබලෙකුව දෙවන ලුතිනන් කෙනෙක් කරන්නෙ නැහැ එහෙම.. අම්මගෙ තාත්තගෙ බූදලෙන් එන කොම්පැණියක වගේ.. එහෙම කළාම අනිත් සොල්දාදුවන්ගෙ මොරාල් එකට මොකද වෙන්නෙ..?

ඉතින් සංක්‍රමණ මහත්තයෝ මුලු රටම ජනාදිපති තුමාගෙ බූදලේ නේන්නම්.. ඒකනෙ අර මුදල් අමාත්‍යංසයේ ලොක්කා මර්වින් ලොක්කා වගේ අය තාමත් යහතින් ඉන්නෙ..

අනේ මගේ කට.. මොකටද කියලා..?

කේන්ති ගන්න එපා සංක්‍රමණ මහත්තයා.. මම විහිලුවට කිව්වෙ.. ඔබ තුමාගෙ කතාව ඇත්ත .. උතුරෙ ඉන්න අපේ වීරෝධාර මල්ලිලා ඔක්කොම කොළඹ ඇවිත් කිරිකට් ගහන්න පටන් ගත්තොත්



තමයි වැඩේ..

අපේ රටේ යුද්දයයි හදිසි නීතියයි භීෂනයයි සේරම ඉස්සරහට දාලා කරන්නෙම නීතිය වැනසීමනේ.. ඕවා කතා කරලා වැඩක් නෑ.. අනික පන්දුක ඔය වගේ එක පාරටම පුම්බන්න හොඳ නෑ.. පිපිරෙන්න පුලුවන්..

ඒ කිව්වෙ සංක්‍රමණ මහත්තයා..?

දැන් ඔය අජන්ත ළමයා පටන් ගත්ත ගමන්මනෙ.. එච්චර වයසකුත් නැති තරුණ කොල්ලෙක්නෙ.. මාධ්‍ය කාරයෝ වට කරගෙන ප්‍රමෝෂන් දීලා අරව මේවා දීලා ඒ ළමයට ඔරොත්තු දෙන්නෙ නැතිව මොලේ අවුල් වුණොත් කවුද වගකියන්නෙ.. ඊට පස්සෙ ඉතින් අර සුසන්තිකා නෝනා වගේ ඔලිම්පික් කොඩිය අරන් යන එක විතරයි මේ ළමයටත් කරන්න වෙන්නෙ..

මාත් හිතුවෙ ඔය ටික මයි සංක්‍රමණ මහත්තයෝ.. කොල්ලව ටික ටික පදම් කරලා ගත්ත නම් මුරලි වගේ දුර ගමනක් යාවි.. කොහෙද.. මට අර සන්නසේ කිරීඩා පිටුව කරන ගොයියත් එක්කත් කේන්තියි.. මං දැක්කා ඇටෙන් පොත්තෙන් පනින් කලින් මොන මොනවදෝ ලියනවා අජන්ත කොලුවා ගැන..

කොහොම උනත් දෙවෙනි ටෙස්ට් මැච් එකෙත් වැඩ පෙන්නන්න ලැබේවි කියලා මං යනවා ටිකක් ව්‍යායාම කරන්න..

ව්‍යායාම ඇඟට ද..?

නෑ ජගිරි මහත්තයා මොලේට.. හොඳ නින්දක් දැම්මම හරි.. පස්සෙ හමුවෙමු..

පංදුක බිලිංකම


